**සිරකරු සුභසාධක අරමුදල - 2019**

**--------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

සිරකරු සුභසාධක අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1973 අංක 18 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුභසාධක අරමුදල් පනතේ 7(1) වගන්තිය සමඟ සංශෝධිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු ගිණුම් කටයුතු සම්බන්ධ හෙළිදරව් කිරීම් යටතේ අරමුදල සඳහා රැස්කරනු ලබන ආදායම් මාර්ගවලින් ලැබීම් අවිනිශ්චිත වීම අරමුදලේ කටයුතු සඳහා රජයේ දායකත්වයක් ලබාගෙන නොමැතිවීම, ප්‍රමාණවත් අරමුදල් සහිතව අරමුදලේ කටයුතු පවත්වාගෙන යාමට නොහැකිවීම හා අරමුදල සඳහා අයවැය සකස්කර නොතිබීම යන කාරණා හේතුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 1 අනුව අරමුදලේ අඛන්ඩ පැවැත්ම පිළිබඳ අනාවරණය කර ගත නොහැකි විය. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. අරමුදලේ ආදායම් මාර්ග අවිනිශ්චිත තත්ත්වයක පැවතීම, රජයේ දායකත්වයක් නොමැති වීම වැනි කරුණු මත අරමුදලේ ශේෂය ප්‍රමාණවත් නොවීම නිසා සමාලෝචිත වර්ෂයේ වැය දැරීමට ප්‍රමාණවත් අරමුදල් නොතිබීමෙන් ඇති වූ තත්ත්වය මත සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුවක් සකස් නොකරන ලද නමුත් අරමුදලේ පරමාර්ථයන් යම්තාක් දුරකට හෝ ඉටු කර ගැනීම සඳහා බාහිර ආයතන හා ස්වේච්ඡා සංවිධාන වල අනුග්‍රහයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව අවධානය යොමු කළ යුතු වීම. |
| (ආ) | (i)ප්‍රමිත අංක 07 හි 25ඡේදය ප්‍රකාරව මුදල් හුවමාරු නොවන ගනුදෙනුවක් හරහා වත්කම් අත්පත් කරගෙන ඇති විට, එහි පිරිවැය එම වත්කම අත්පත්කර ගත් දිනට පැවති සාධාරණ වටිනාකමට අගය | විගණන නිරීක්ෂණ හා එකඟ වේ. බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතු සියළු ස්ථාවර වත්කම් විසර්ජන ගිණුම මඟින් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය යටතේ විගණනය විසින් දක්වා ඇති | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| කල යුතුය. එසේ වුවද බන්ධනාගාර ආයතන 04 කට ලැබී තිබුණු පරිත්‍යාග වත්කම් අයිතම 25 ක හා 2017-2018 කාලපරිච්ඡේදය තුලදී බන්ධනාගාර ආයතන 04 ක් සඳහා ලැබී තිබුණු පරිත්‍යාග වත්කම් අයිතම 528 ක සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කර නොතිබුණි. | සියළු වත්කම් වල පිරිවැයන් ගණනය කර ඉදිරි වර්ෂයේ විසර්ජන ගිණුමෙන් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව විගණනය වෙත දැනුම් දෙමි. | |
| (ii)උක්ත ප්‍රමිතයේ 70 ඡේදය ප්‍රකාරව වත්කමක ප්‍රයෝජනවත් ජීවිත කාලය නිශ්චය කිරීමේදී වත්කමෙහි අපේක්ෂිත භාවිතය හා වත්කමෙහි අපේක්ෂිත ධාරිතාවය සැලකිල්ලට ගත යුතුයි. එසේ වුවද, අරමුදලට පරිත්‍යාග කර තිබූ වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය නිශ්චය කර ක්ෂය ප්‍රතිශතය තීරණය නොකර, 2003 වර්ෂයේදී කමිටුවක් මගින් තීරණය කළ, ක්ෂය අනුපාත පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේදී ලැබූ පරිත්‍යාග වත්කම් රු.2,555,334 ක් ක්ෂය කර තිබුණි. | සිරකරු සුභසාධක අරමුදල සඳහා පරිත්‍යාග ලෙස ලැබෙන වත්කම් සිරකරුවන්ගේ පරිහරණය සඳහා ලැබෙන ඒවා වේ. එම වත්කම් වල අපේක්ෂිත භාවිතය එම වත්කම් පරිත්‍යාග කරනු ලබන කාර්යයන්ගේ ස්වභාවය, වත්කමේ පැවැත්ම යනාදිය සැලකිල්ලට ගෙන ක්ෂය අනුපාත තීරණය කර ඇත. එම අනුපාත බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුභසාධක අරමුදල යටතේ ඇති ස්ථාවර වත්කම් වල ක්ෂය කිරීම් සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි උපදෙස් වලට අනුව 2003 වර්ෂයේ පත් කරන ලද කමිටුවක් විසින් තීරණය කරන ලද ක්ෂය අනුපාත වේ. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතු වීම. |

**1.5.2. ගිණුම්කරණ ප්‍රතිපත්ති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පරිත්‍යාග ලෙස ලැබෙන වත්කම්වල වටිනාකම ගිණුම්ගත කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට පරිත්‍යාග වත්කම්වල ධාරණ අගය රු.10,030,844 ක් වුවද, එදිනට පරිත්‍යාග වත්කම් සංචිත ගිණුමේ ශේෂය රු.23,507,728 ක් වශයෙන් දක්වා තිබුණි. | පරිත්‍යාග වත්කම් ලෙස ලැබෙන වත්කම් වල වටිනාකම හඳුනාගෙන එම වත්කම් වල අගය ප්‍රාග්ධනිත කිරීමට නොමිලේ වත්කම් ප්‍රදානයන් සංචිත ගිණුමට බැර කර ඇත. ඒ අනුව 2019.12.31 දිනට එම ගිණුමේ ශේෂය රු.23,507,729/- කි. මෙම ප්‍රාග්ධනිත කරන ලද පරිත්‍යාග වත්කම් භාවිතයේදී, වාර්ෂික ක්ෂයවීම් ඒ ඒ වර්ෂයේ ආදායම් වියදම් ගිණුමෙන් | හඳුනාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව පරිත්‍යාග වත්කම් නිවැරදිව ගිණුම්ගත කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | කපාහැර ඇත. එම හේතුවෙන් ක්ෂයවීම් වලට සමාන අගයකින් සිරකරු සුභසාධක අරමුදලේ පරිත්‍යාග වත්කම් වල ධාරණ අගය, ක්ෂයවීම් අඩුකර මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කර ඇත. | |
| (ආ) | බන්ධනාගාර ආයතන වෙත පරිත්‍යාග වශයෙන් ලැබෙන පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ගිණුම්ගත කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබීම හේතුවෙන් බන්ධනාගාර ආයතන 10 ක් වෙත ලැබී තිබුණු රු.997,300 ක් වූ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද ඉතිරි බන්ධනාගාර 20 හි පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ලැබීම් වටිනාකම ගණනය කිරීමට හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | පරිත්‍යාග වශයෙන් ලැබෙන පරිභෝජ්‍ය වත්කම් සිරකරුවන්ගේ පරිහරණය සඳහා පරිත්‍යාග කරන භාණ්ඩ වන අතර එම භාණ්ඩ සිරකරුවන්ගේ පරිහරණය සඳහා ලබා දීමට කටයුතු කරයි. එහිදී එම භාණ්ඩ පරිභෝජනයෙන් අවසන් වීම හේතුවෙන් ඒවා තොග ලෙස අවසන් ගිණුමට ගැලපීම් සිදු නොකරයි. 2019.12.31 දිනට සිරකරු සුභසාධක අරමුදලේ අවසන් ගිණුමේ ගිණුම් කටයුතු හෙළිදරවු කිරීම් යටතේ අංක 16 මගින් හෙළිදරවු කර ඇත. | හඳුනාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තියකට අනුව පරිත්‍යාග ලෙස ලැබෙන පරිභෝජ්‍ය ද්‍රව්‍යවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු වීම. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බෝගම්බර බන්ධනාගාරය, දුම්බර බන්ධනාගාරයට විතැන්කිරීමෙන් පසුව අස්ථානගතව තිබූ හා කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ අස්ථානගතව තිබූ වටිනාකම පිළිවෙලින් රු.181,365 ක් හා රු.46,500 ක් වූ පරිත්‍යාග වත්කම් පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වේ. ඒ අනුව ඉදිරියේදී භෞතික වශයෙන් නොපවතින භාණ්ඩ විධිමත් පරිදි පොත් වලින් ඉවත් කර ගැනීමට අවශ්‍ය උපදෙස් බන්ධනාගාර අධිකාරිවරුන්ට ලබා දීමට සටහන් කර ගත් බවත් ඉදිරියේදී විධිමත් කමිටුවක් පත් කර එමඟින් මෙම වත්කම් පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුගමනය කළ යුතු වේ. |
| (ආ) | 1998 - 2011 කාලපරිච්ඡේදය තුළ නව මැගසින් බන්ධනාගාරය වෙත පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ, 2012 වර්ෂයේ ගින්නෙන් විනාශ වූ පිරිවැය රු.668,431 ක් වූ පරිත්‍යාග වත්කම් 41 ක් පොත්වලින් ඉවත් කිරීමට කටයුතු | විගණන නිරීක්ෂණ හා එකඟ වේ. 2012.01.24 දින මැගසින් බන්ධනාගාරයේ ඇති වූ කැරැල්ලේ ගින්නෙන් විනාශ වූ භාණ්ඩ පොත් වලින් කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට | හානිවූ වත්කම් පොත්වලින් ඉවත් කර නිසි පරිදි ගිණුම් නිවැරදි කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| කර නොතිබුණි. තවද, 2011-2016 කාලපරිච්ඡේදය තුල පරිත්‍යාග වශයෙන් ලැබී අබලි භාණ්ඩ ලෙස භාවිතයෙන් ඉවත් කරන ලද පිරිවැය රු.895,244 ක් වූ පරිත්‍යාග වත්කම් 59 ක් ද පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. එම හේතූන් නිසා ගින්නෙන් විනාශ වූ හා අබලි වූ භාණ්ඩ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.55,830 ක් ක්ෂය වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර තිබුණි. | අවශ්‍ය අයදුම්පත් සම්පූර්ණ කර අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර ඒ සඳහා මේ වන තෙක් අනුමැතිය ලැබී නොමැති බැවින් එම විනාශ වූ වත්කම් පොත් වලින් කපා හැරීම සිදු කළ නොහැකි වීම නිසා එම වත්කම් සඳහා වාර්ෂිකව ක්ෂය ගණනය කර අවසන් ගිණුම් මඟින් ගලපා ඉදිරිපත් කරනු ලබයි. මෙම වත්කම් පොත් වලින් ඉවත් කිරීම සඳහා ඉදිරි කටයුතු විධිමත්ව සිදු කිරීමට කටයුතු කරන බව. | |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බන්ධනාගාර ආයතන 16 ක පරිත්‍යාග වත්කම් ලේඛනයේ 1997 දෙසැම්බර් 31 දිනට හීන වූ අගය ලෙස ඉදිරියට ගෙනවිත් තිබූ පිරිවැය රු.2,220,016 ක පරිත්‍යාග වත්කම්වලට අදාල උපලේඛනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විගණනය විසින් දක්වා ඇති පරිත්‍යාග වත්කම් ක්ෂය ලේඛණයේ 1997 දෙසැම්බර් 31 දිනට ශේෂය ලෙස පමණක් සඳහන් කළ රු. 2,220,216 ක පරිත්‍යාග වත්කම් ශේෂයන් ලෙජරය තුළ ඉදිරියට ගෙනා ශේෂයක් ලෙස පැවති බැවින් එය එලෙසම පවත්වාගෙන යනු ලබයි. | ඉදිරියට ගෙන එන ලද වත්කම්වල ක්ෂය සහ උපලේඛන ඉදිරිපත් කළ යුතු වීම. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1979 අංක 54 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභාසාධක අරමුදල් (සංශෝධන) පනත | | | |
| | (i) (අ අ) වගන්තිය | වර්ෂයකට නොඅඩු කාලයක් තුළ හිමිකම්පානු නොලැබූ වේතන හා පෞද්ගලික මුදල් | අදාළ ආයතනවලින් හිමිකම් නොපෑ මුදල් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ වාර්තාවක් කැඳවා ඒවා සිරකරු සුභසාධක අරමුදලට බැර කිරීමට බන්ධනාගාර | සිරකරු සුභසාධක අරමුදල් පනතේ විධිවිධාන අනුගමනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | රු.4,228,197 ක් අරමුදලට බැර නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | අධිකාරීවරුන්ට අවශ්‍ය උපදෙස් ලබා දීමට කටයුතු කරන බව. | |
| (ii) 04 වන වගන්තිය | සමාලෝචිත වර්ෂයේ අරමුදලේ ආදායම රු.767,912 ක් වූ අතර ආදායම වැඩිකර ගැනීම සඳහා පනත ප්‍රකාරව ප්‍රතිපාදන සලසා ඇති ආදායම් මාර්ග 10 යටතේ ආදායම් එකතු කර ගැනීමට ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම කෙරෙහි නිසි අවධානයක් යොමු කර නොතිබුණි. | සිරකරු සුභසාධක අරමුදල් පනතේ දක්වා ඇති ආදායම් ප්‍රභවයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කර අරමුදලේ ආදායම වැඩිකර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් කටයුතු කරන ලෙස බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන) වෙත උපදෙස් ලබා දීමට සටහන් කරගත් බව. | පනත ප්‍රකාරව අරමුදලේ ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 | වැලිකඩ, මැගසින් හා අනුරාධපුර බන්ධනාගාර ආයතනවල අභ්‍යන්තර කැරලිවලින් හානියට පත්වූ පරිත්‍යාග වත්කම් හා ගාල්ල බන්ධනාගාරයේ 2014 දෙසැම්බර් 26 සුනාමි ව්‍යසනයෙන් විනාශ වූ භාණ්ඩ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | ලිපිලේඛන වල අඩුපාඩු නිවැරදි කර එවන ලෙස අදාල බන්ධනාගාර අධිකාරීන් ට දන්වා ඇති අතර මැගසින් බන්ධනාගාරයේ කැරල්ල සම්බන්ධව අලාභය කපා හැරීමට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට යවා ඇත. | මුදල් රෙගුලාසි විධිවිධාන අනුගමනය කළ යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,359,184 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.281,121 ක අතිරික්තයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,640,305 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව අරමුදලේ ආදායම රු.1,147,589 කින් අඩුවීම හා වියදම් රු. 492,717 කින් වැඩිවීම ඉහත ඌනතාවය ඇතිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අරමුදලට ලැබීම් රු.768,031 ක්ද ඇතුලුව අරමුදලේ රු.3,604,646 ක ශේෂයක් පැවතිය ද පනතේ 5 වගන්තිය අනුව සිරකරු සුභසාධක අරමුදලේ කාර්යභාරය වන සිරකරුවන් වෙනුවෙන් සුභසාධක වැඩසටහන් පැවැත්වීම සඳහා ඉන් සියයට 20 ක් එනම් රු.721,015 ක් පමණක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී ලැබී තිබූ සමස්ත ආදායමෙන් සියයට 83 ක් වූ රු.617,565 ක් බන්ධනාගාර ආයතන 06 ක සිරකරුවන්ගේ ශ්‍රමය සැපයීමෙන් ලද ආදායම් විය. | 2018.01.01 දිනට සිරකරු සුභසාධක අරමුදලේ ශේෂය රු.921,329 ක් වූ අතර 2019 වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුව සකස් කරනු ලබන 2018 ජුනි මාසය වන විට එහි ශේෂය රු.1,276,863 ක් විය. ඒ අනුව එම ශේෂය සලකා බලා 2019 වර්ෂයට අදාළ ඇස්තමේන්තුව සකස් කරන ලද බැවින් රු.1,000,000 ක් සඳහා වූ වටිනාකමක් සඳහා පමණක් වැය ඇස්තමේන්තුවක් සකස් කරන ලද අතර එම ඇස්තමේන්තුගත වියදමෙන් 72% ක ප්‍රතිශතයක් වූ රු.721,015 ක් සිරකරු සුබසාධන වැඩසටහන් වෙනුවෙන් වියදම් දරා තිබුණි. සිරකරු සුභසාධක අරමුදලේ ප්‍රධාන අදායම් ප්‍රභවයක් වන සිර ශ්‍රමය සැපයීමෙන් වූ ආදායම් වලින් මුළු ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් වූ 83% ක් නිරූපණය වන අතර ඉතිරි 17% අනෙකුත් අදායම් ප්‍රභවයන් 05 ක් මඟින් නිරූපණය වේ. ඒ අනුව සිරකරු සුභසාධක අරමුදල් පනතේ දක්වා ඇති ආදායම් ප්‍රභවයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කර අරමුදලේ ආදායම තවදුරටත් වැඩිකර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් කටයුතු | පනතේ අරමුණු ඉටුකර ගැනීමට හා පනතේ සඳහන් ආදායම් ප්‍රභවයන්ට අනුව අරමුදල් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | කරන ලෙස බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන) වෙත උපදෙස් ලබා දීමට සටහන් කරගත් බව. | |
| (ආ) | ඉකුත් වර්ෂයේ සිරකරුවන් වෙනුවෙන් සුභසාධන වැඩසටහන් කිසිවක් පවත්වා නොතිබුණු අතර 2017 වර්ෂය ඇතුලුව ඉකුත් වර්ෂ 05 ක වැඩසටහන් පැවැත්වීම සඳහා දරා තිබූ වියදමෙහි සාමාන්‍යය වූ රු.2,515,269 ක් හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ දී ඒ සඳහා දරා තිබූ වියදම සියයට 71 කින් පමණ අඩු වී තිබුණි. | 2018 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුවක් සකස් නොකිරීම නිසා එම වර්ෂය සඳහා සුබසාධන වැඩසටහන් සඳහා කිසිඳු වියදමක් දරා නොතිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත වියදමෙන් 72% ක ප්‍රතිශතයක් වියදම් වශයෙන් දරා තිබුණි. | ප්‍රමාණවත් පරිදි සුභසාධන වැඩසටහන් පැවැත්විය යුතු වීම. |
| (ඇ) | අරමුදලේ ප්‍රගතිය මැණීම සඳහා කාර්යසාධන දර්ශක හඳුන්වා දී නොතිබූ අතර බන්ධනාගාර ආයතනවල පැවැත්විය යුතු වැඩසටහන්වල ස්වභාවය, සහභාගි කළයුතු සිර/සැකකරුවන් සංඛ්‍යාව, දැරීමට සිදුවන පිරිවැය සඳහන් කරමින් වැඩසටහන් පිළිබඳ පූර්ව සැලැස්මක් ද එම සැලැස්මට අනුව ප්‍රගතිය ද වාර්තා කර නොතිබුණි. එම හේතුවෙන් සැලසුම් කරන ලද සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා සැසඳීමෙන් අරමුදලේ අරමුණු ඉටුකිරීමට අදාල මූල්‍ය හා භෞතික කාර්යසාධනය ඇගයීමට නොහැකි විය. | අනුමත වාර්ෂික ඇස්තමේන්තුව සඳහා ක්‍රියාකාරී සැලස්මක් සකස් කරන අතර එහි අපේක්ෂිත වැඩසටහන් සංඛ්‍යාව, සහභාගී වන නේවාසික සංඛ්‍යාව (සිර/සැක) සහ අපේක්ෂිත වියදම යන තොරතුරු ඇතුලත් කරනු ලබන අතර ඒ අනුව එම වැඩසටහන් සඳහා ප්‍රතිපාදන හා අරමුදල් නිදහස් කිරීම සිදු කරනු ලබයි. තවදුරටත් අරමුදලේ ප්‍රගතිය මැනීම සඳහා කාර්යසාධන දර්ශක හඳුන්වා දීමට කටයුතු කරන ලෙස බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන) වෙත උපදෙස් ලබා දීමට සටහන් කරගත් බව. | අරමුදලේ ප්‍රගතිය මැනීම සඳහා කාර්යසාධන දර්ශක හඳුන්වා දිය යුතු වීම. |
| (ඇ) | මඩකළපුව හා කළුතර බන්ධනාගාර මඟින් සමාලෝචිත වර්ෂය තුළ දී සිරකරුවන් වෙනුවෙන් කිසිදු සුභසාධන වැඩසටහනක් පවත්වා නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මඟින් කළුතර හා මඩකලපුව යන බන්ධනාගාර වෙත සුභසාධන වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර අරමුදලට අදාළව සිරකරුවන් වෙනුවෙන් සිදු කරනු ලබන සුබසාධන කාර්යයන් ස්වේච්ඡා ආයතන, සිරකරු සුභසාධක උප සංගම්, බාහිර ආයතන හා පුද්ගලයන්ගේ දායකත්වය මත සැලසුම් කළ වැඩසටහන් සිදු කරන ලදී. | පනත ප්‍රකාරව වැඩසටහන් පැවැත්විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | දිවයින පුරා පිහිටි බන්ධනාගාර ආයතන 30 න් බන්ධනාගාර ආයතන 04 ක් සිරකරුවන්ගේ අධ්‍යාත්මික හා ආගමික සුබසාධනය වෙනුවෙන් කිසිදු වැඩසටහනක් අරමුදල මගින් පවත්වා නොතිබුණු අතර බන්ධනාගාර ආයතන 10 ක් විසින් අධ්‍යාපනික සුභසිද්ධිය හා සුභසාධනය සඳහා වන වැඩසටහන් කිසිවක් ද, බන්ධනාගාර ආයතන 09 ක් විසින් විනෝද ක්‍රීඩා හා වෙනත් පහසුකම් සැපයීමට අදාල වැඩසටහන් කිසිවක් ද, බන්ධනාගාර ආයතන 14 ක් සිරකරුවන්ට ත්‍යාග ලබා දීම්වලට අදාලව වැඩසටහන් කිසිවක් ද, අරමුදල මගින් පවත්වා නොතිබුණි. තවද සිරකරුවන් බන්ධනාගාරයෙන් නිදහස්කරනු ලැබීමෙන් පසුව ඔවුන්ගේ පුනරුත්ථාපනයෙහි ලා උපකාරීවන පශ්චාත්භාර සේවා සඳහා වීරවිල බන්ධනාගාරය පමණක් රු.5,000 ක් වැය කර තිබීමෙන් පනත ප්‍රකාරව අරමුණ ඉටුවී නොතිබුණි. | සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම තුල සියලුම බන්ධනාගාර ආයතන සඳහා සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අතර ඒවායින් ඇතැම් වැඩසටහන් සඳහා අපේක්ෂිත වියදමක් ඇස්තමේන්තු නොකරන ලද්දේ ඒ ඒ බන්ධනාගාර ආයතන වලට සම්බන්ධ සිරකරු සුභසාධක සංගමයේ ප්‍රාදේශීය කමිටු හා රාජ්‍ය/රාජ්‍ය නොවන අනුග්‍රහය මත සිදුවන බැවිනි. අපේක්ෂිත වියදමක් ඇස්තමේන්තු කරන ලද වැඩසටහන් සඳහාද එලෙස අනුග්‍රහය ලද බැවින් ආයතන සඳහා සැලසුම් කරන ලද වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. | පනතේ විධිවිධාන ප්‍රකාරව අරමුණු ඉටු කරගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

-------------------------------------

**4.1 අයවැය පාලනය**

-----------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 දෙසැම්බර් 26 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදයේ සඳහන් පරිදි අරමුදලෙහි අරමුණුවලට අනුකූලව භාණ්ඩාගාරය විසින් අඳුන්වා දී ඇති ආකෘති පත්‍රවලට අනුව පිළියෙල කරන ලද වාර්ෂික අයවැය ලේඛනය අදාළ අනුමැතීන් සහිතව සැප්තැම්බර් 30 දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වෙත ඉදිරිපත් කළයුතුයි. එසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනය පිළියෙල කර නොතිබියදී මූල්‍ය ප්‍රකාශ සමඟ අයවැය ගත සංඛ්‍යා හා තත්‍ය සංඛ්‍යා අතර විචල්‍යතා ප්‍රකාශයක් ඉදිරිපත් කර තිබුණි. | 2019 වර්ෂය සඳහා නියමිත පරිදි ඇස්තමේන්තුවක් සකස් කර ඇති බව. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කල යුතු වීම. |